**පුනාකරෙයි ප්‍රාදේශීය සභාව**
**කිලිනොච්චි දිස්ත්‍රික්කය**

----------------------------

## 1 මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජුනි 18 දින ද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 ජුලි 18 දිනද සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට පුනාකරෙයි ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**(අ) ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | ඇස්තමේන්තු කළ රු. 850,000 ක් වටිනා මූලධන ව්‍යාපෘති දෙකක් ඉටුනොකර මූලධන වියදම් ලෙස ගිණුම්වල එකතු කර ඉදිරිපත් කර තිබූ අතර වියදම් ණයහිමි ගිණුමෙහිත් එකතු කර දක්වා තිබුණි. | විදුලි සෝපානය ඉදිකිරීම් කාර්යය සඳහා සභාවේ ආදායම් ප්‍රමාණවත් නොවීම නිසා මාර්ග ප්‍රතිසංස්කරණ කාර්යය අවසන් කිරීමට ක්‍රියා මාර්ග ගෙන ඇත. | එළදායි අයුරින් ඇස්තමේන්තු සකස් කර ව්‍යාපෘති නිම කළ යුතුවේ. |
| (ii) | කොන්ත්‍රාත්කරුවන්ගේ ඇප මුදල් රු.83,241ක් අත්තිකාරම් ගිණුම්වල ඉදිරිපත් කිරීම නිසා අත්තිකාරම් ගිණුම් වැඩියෙන් දක්වා තිබුණි. | මෙම දෝෂය නිවැරදි කර ඇත. | ගිණුම් නිවැරදි අයුරින් ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුවේ. |
| (iii) | 2018 වර්ෂයේ නෙට්පුලවු මාර්ගය ව්‍යාපෘතිය මූලධන වියදම් ලෙස ඉදිරිපත් කර මූලධන කාර්යය ඉටුනොකර වියදම් ණය හිමියන් ගිණුම්වලින් රු.300,000ක් දැක්වීම නිසා වියදම් ණයහිමි ගිණුම් ශේෂය වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | කාර්යය දැනට අවසන් කර වාර්තා ඉදිරිපත් කර ඇත. | ගිවිසුම් ප්‍රකාරව, අදාල ව්‍යාපෘති සම්පූර්ණ කළ යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| (iv) | ක්ෂය වෙන්කිරීම් රු.210,000ක් ක්ෂය වෙන්කිරීම් ගිණුමට හර නොකර සමුච්චිත අරමුදල් ගිණුමට හර කිරීම නිසා, සමුච්චිත ගිණුම වැඩියෙන් දක්වා තිබුණි. | ඉදිරි වර්ෂයේදී ක්ෂය වෙන්කිරීම් මූලධන වෙන්කිරීම් ලෙස ගිණුම්ගත කිරීමට කටයුතු කරනු ලැබේ. | මූලධන වෙන්කිරීම් ගිණුමේ දැක්විය යුතුවේ. |

**(ආ) නොසැසඳු ගිණුම්**

| | විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂ අවසානයේ ආයුර්වේද වෛද්‍ය ශාලාවේ භෞතික බෙහෙත් ද්‍රව්‍ය තොගයේ එකතුව රු.317,061ක් ලෙස පැවැති අතර මූල්‍ය ප්‍රකාශනවල ආයුර්වේද වෛද්‍ය ශාලා බෙහෙත් තොගය ලෙස රු.282,430ක් දැක්වීම නිසා රු.34,631ක් වටිනා ආයුර්වේද වෛද්‍ය ශාලා බෙහෙත් තොග මූල්‍ය ප්‍රකාශනවල අඩුවෙන් දක්වා තිබුණි. | මෙම දෝෂය සැලකිල්ලට ගෙන නිවැරදි කරනු ලැබේ. | ගිණුම් සැසඳිය යුතුවේ. |
| (ii) | 2019 දෙසැම්බර් 31 දින ලිපිද්‍රව්‍ය තොග ලේඛනයේ ශේෂය රු.143,853ක් ව පැවැති අතර මූල්‍ය ප්‍රකාශනවල ලිපිද්‍රව්‍ය තොග ලේඛනයේ ශේෂය රු.33,401ක් දක්වා තිබීම නිසා රු. 110,452කින් වෙනස්වී තිබුණි. | මෙම දෝෂය සැලකිල්ලට ගෙන නිවැරදි කරනු ලැබේ. | ගිණුම් සැසඳිය යුතුවේ. |
| (iii) | මූලධන උපයෝජනය සඳහා මූලධන ආධාර ගිණුමේ ශේෂය රු.140,627,654ක් ලෙසත් සභාවේ ස්ථාවර වත්කම් එකතුව රු.139,164,596ක් ලෙස දැක්වීම නිසාත් රු.1,463,058කින් වටිනාකම වෙනස් වි පැවතුණි | පිළිතුරු ඉදිරිපත් කර නොමැත. | ගිණුම් සැසඳිය යුතුවේ. |

**(ආ) විගණනයට අවශ්‍ය ලිඛිත සාක්ෂි නොවීම**

| විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල ස්ථාවර වත්කම් ලෙස දක්වා ඇති රු.1,463,914ක උපකරණ හා විදුලි සම්බන්ධතා අයිතමයන් සඳහා ස්ථාවර වත්කම් ලේඛන සහ උපකරණ තොග සමීක්ෂණ මණ්ඩල වාර්තා විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා ගිණුම්වල ඉදිරිපත් කර ඇති වත්කම්වල වටිනාකම විගණනයේදී තහවුරු කළ නොහැකි වී ඇත. | ස්ථාවර වත්කම් ලේඛන සහ උපකරණ තොග ලේඛන පවත්වාගෙන යාමට කටයුතු කර ඇත. | අදාල ලේඛන පවත්වාගෙන යා යුතුවේ. |

**1.4** **අනුකූල නොවීම**

| | විගණන නිරීක්ෂණ | | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශ |
|---|---|---|---|---|---|
| | නීති, රීති සහ රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම් | | |
| | | රු. | | | |
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 571 | 868,715 | වර්ෂ 02 ක් ඉක්ම වූ තැන්පතු 28 ක් සම්බන්ධයෙන් ඵලදායි පියවර ගෙන නොතිබුණි. | තැන්පතු 02 ක් ආපසු ගෙවා ඇත. අනෙකුත් තැන්පතු ගෙවීම සඳහා කටයුතු කර ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | මුදල් රෙගුලාසි 371 මඟින් සංශෝධිත 2015 ජුලි 14 දිනැති අංක 03/2015 දරන චක්‍රලේඛයේ 371(2)(ආ) | 128,320 | මාණ්ඩලික නිලධාරියෙකුගේ නමින් තත්කාර්ය අතුරු අග්‍රිම ලබානොදී පුද්ගලික ආයතනයක නමට අත්තිකාරම් නිකුත් කර තිබුණි. | දැන් නිවැරදි කර ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 151 වගන්තිය | - | ව්‍යාපාර අරමුණු සඳහා උපයෝජනය කරනු ලබන දේපළ සඳහා ඉඩ ප්‍රමාණයේ වර්ගඵලයට වාර්ෂික වටිනාකමින් වරිපනම් බදු තිරණය නොකර විදුලි සංදේශ කුළුණු සඳහා වාර්ෂික වෙළෙඳ බලපත්‍ර ගාස්තු අයකර තිබුණි. | කල් ඉකුත්වූ සිදුවීමක් නිසා අයකර ගැනීමේදි ගැටළු පවතී. | පනතේ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඈ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ පළාත් මූල්‍ය රීති අංක 163.3(ii) | 449,704 | අත්තිකාරම් ගෙවීම් 05ක් නිරවුල් කර නොතිබුණි. | සියළුම අත්තිකාරම් නිරවුල් කර ඇත. | පළාත් මූල්‍ය රීතිවලට අනුව කටයුතු කළ යුතුය. |
| (ඉ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍ර යේ 1989 අප්‍රේල් 17 දිනැති VII පරිශිෂ්ඨයේ 16 හා | | ප්‍රධාන ලෙජර් ගිණුමක් රාජ්‍ය ආදායම්, වියදම්, අත්තිකාරම්, තැන්පතු, ණය, ස්ථාවර තැන්පතු සහ අදාල ගිණුම් සඳහා සකස් කළ යුතු බව | ප්‍රධාන ලෙජර් ගිණුම් සකස් කිරිමට කටයුතු කරනු ලැබේ. | ප්‍රධාන ලෙජර් ගිණුම් සකස් කළ යුතුවේ. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | 165 වගන්ති ප්‍රකාරව | | සඳහන් වුවත් සභාව විසින් ප්‍රධාන ලෙජර් ගිණුම් සකස්කර නොතිබුණි. | | |
| (ඊ) | (i) පළාත් පාලන කොමසාරිස් (ආදායම්) ගේ 2016 මැයි 25 දිනැති අංක 04/2016 දරන චක්‍රලේඛය | 9,771,416 | රජයේ හිඟ බදු, හිඟ මුදල් අයකිරීම් පිළිබඳ මාසික වාර්තා ප්‍රා. ස. 07 ගිණුම් වාර්තා මාසිකව පිළියෙල කළ යුතු බවට සඳහන් කර තිබුණද, සභාව විසින් ප්‍රා.ස. 07 පිළියෙල කර නොතිබුණි. | ඉදිරියේදී මෙවැනි දෝෂ සිදු නොවීමට කටයුතු කර ඇත. | චක්‍රලේඛයට අනුව කටයුතු කළ යුතුය. |
| | (ii) 2000 වර්ෂයේ අංක 46 දරන කෘෂිකර්ම සංවර්ධන පනත 32(1) වගන්තිය | - | සභා බලප්‍රදේශයේ පවතින ගොවිතැන් ඉඩම්වල නිවාස 42ක් ඉදිකර තිබුණත් සභාව විසින් එලදායි ක්‍රියාමාර්ග කිසිවක් ගෙන නොතිබුණි. | නීතිමය වශයෙන් ක්‍රියාමාර්ග ගනිමින් පවතී. | පනතේ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2 මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම් රු.10,539,575 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම් රු. 5,621,348 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්,රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | 2019 | | | 2018 | | |
|---|---|---|---|---|---|---|---|
| | | ඇස්තමේන්තුගත ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය අනුව මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 369,000 | 539,785 | - | 212,550 | 197,570 | 3,850 |
| (ii) | කුලී | 3,882,255 | 3,816,574 | 1,383,562 | 2,531,460 | 2,591,008 | 951,617 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 319,400 | 922,622 | 5,000 | 409,120 | 701,286 | - |
| (iv) | වෙනත් ආදායම් | 6,311,370 | 34,809,529 | 8,340,780 | 7,075,140 | 8,988,534 | 7,087,696 |
| | | 10,882,025 | 40,088,510 | 9,729,342 | 10,228,270 | 12,478,398 | 8,043,163 |

## 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණ | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2019 වර්ෂ අවසානයේ පැවති රු.1,383,564 ක් වූ කුලී හා බදු වර්ෂ 01 සිට වර්ෂ 08 ක් දක්වා අය කර නොමැතිව පැවැති නමුත් හිඟ හිට කුලී අයකර ගැනීමට කටයුතු කර තිබුණි. | හිඟ ආදායම් අයකිරීම සඳහා එකඟතා කමිටුවේ ක්‍රියාමාර්ග සඳහා යවා ඇත. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සභාව විසින් ආදායම් ලැයිස්තු ගත කර රැස්කිරීම සඳහා යෝග්‍ය ක්‍රියාමාර්ග කිසිවක් පසුගිය වර්ෂ 10 කට අධික කාලයක සිට ගෙන නොතිබුණි. | ආසන්නතම ආදායම් ඇස්තමේන්තුවේ ලැයිස්තුගත කර අයකිරීමට කටයුතු කර ඇත. | ආදායම් ලැයිස්තුගත කර අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | සහික දීමනා රු.42,074ක් පසුගිය වර්ෂ 03කට අධික කාලයක සිට හිඟහිටි ලෙස ගිණුම්වල ඉදිරිපත් කර තිබූ අතර මෙය අයකර ගැනීම සඳහා එලදායි පියවර ගෙන නොතිබුණි. | අයකිරීමට කටයුතු කර ඇත. | හිඟහිටි ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 2.3.3 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 139 වගන්තිය ප්‍රකාරව වරිපනම් සඳහා තක්සේරු කිරීම් තොරතුරු රැස්කිරීම සභාව විසින් සිදු නොකිරීම නිසා ගොඩනැගිලි, නිවාස, ඉඩම් ආදිය මත බදු තක්සේරු කර එහි වටිනාකම පදනම් කරමින් වරිපනම් අයකිරීමේ ක්‍රියාවලියක් අනුගමනය කර නොතිබූ අතර වාර්ෂිකව වරිපනම් බදු අයකිරීම් මගින් වරිපනම් බදු අයකිරීම සිදු කර නොතිබූ හෙයින් සභාවේ ආදායම්වල අඩුවීමක් සිදුවී තිබේ. | පනත මගින් පනවා තිබූ ගාස්තු අයකරනු ලැබේ. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |

## 2.2.4 උසාවි දඩ මුදල් සහ මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයා සහ සියළුම බලධාරීන්ගෙන් 2019 දෙසැම්බර් 31 දිනට රු.6,205,717 ක උසාවි දඩ මුදල් සහ රු.2,080,313 ක මුද්දර ගාස්තු ලැබිය යුතුව තිබුණි. | ඉල්ලීම් ලිපි ආදායම් බදු දෙපාර්තමේන්තුවට යවා ඇති නමුත්, එම ගාස්තු මේ දක්වා ලැබී නොතිබුණි. | නියමිත කාලය තුළ අයකිරීමට කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුබසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තවයන් ඉටු කිරීම පිළිබඳ අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

#### (අ) අතුරු ව්‍යවස්ථා

| විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය ප්‍රකාරව, ප්‍රධාන කාරණා 33ක් සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථා සකස් කර ක්‍රියාත්මක කර තිබිය යුතුය. එසේ වුවත්, 2019 දෙසැම්බර් 31 දින වන විටත් කිසිදු අතුරු ව්‍යවස්ථාවක් ස්ථාපිත කර නොතිබුණි. | සභාවේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර ඒ අනුව ක්‍රියා කිරීමට කටයුතු කළ යුතුය. | පනතේ ප්‍රකාරව අතුරු ව්‍යවස්ථා ස්ථාපිත කළ යුතුවේ. |

#### (ආ) අරමුණුවලට පටහැනි ක්‍රියාකාරකම්

| විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සුසාන භූමි සඳහා වෙන් කළ අරමුදල් සුසාන භූමි කාර්යයන් සඳහා උපයෝජනය නොකර සමාලෝචිත වර්ෂය අවසානයේ වීථි ලාම්පු මිලදී ගැනීමට රු.411,250ක් උපයෝජනය කිරීම වූ කලී සැලැසුම් කළ අරමුණට පටහැනිව සිදු කළ ක්‍රියාකාරකමක් ලෙස නිරීක්ෂණය විය. | අදාල ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දි පවතින දුෂ්කරතා සැලකිල්ලට ගෙන ඇස්තමේන්තු කළ කාර්යය වෙනුවට අත්‍යාවශ්‍ය ව්‍යාපෘති සභාව යෝජනා කර තිබුණි. | ඇස්තමේන්තු ප්‍රකාරව කාර්යයන් ක්‍රියාත්මක කළ යුතුවේ. |

#### (ඇ) අතහැර දැමූ ක්‍රියාකාරකම්

| විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තු කළ රු.1,111,000ක් වටිනා ව්‍යාපෘති 03ක් අපේක්ෂිත ප්‍රතිඵල අත්කර නොගෙන මෙහෙයුම් සම්පූර්ණයෙන් අත්හැර දමා තිබුණි. | ප්‍රවර්තන වර්ෂයේ ක්‍රියාත්මක කිරීමේ දි පවතින දුෂ්කරතා සැලකිල්ලට ගෙන ඇස්තමේන්තු කළ කාර්යය වෙනුවට අත්‍යාවශ්‍ය ව්‍යාපෘති සභාව යෝජනා කර තිබුණි. | ඇස්තමේන්තු ප්‍රකාරව කාර්යයන් ක්‍රියාත්මක කර නියමිත ප්‍රතිලාභ අත්කර ගත යුතුවේ. |

(ඇ) **ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

| විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (i) සභා බල ප්‍රදේශයට අයත් අපද්‍රව්‍ය නිවාස, කඩකාමර, හෝටල්, එළවළු සහ පළතුරු විකුණුම් අලෙවි සැල්, මස් කඩ, කර්මාන්ත ශාලා, රෝහල්, පොදු ස්ථාන ආදියෙන් ලැබෙන අපද්‍රව්‍ය අදාල ස්ථානයට උචිත පරිදි ඝන අපද්‍රව්‍ය වෙන්කිරීමේ ක්‍රමවේදය අනුගමනය කර නොතිබුණි. | ආරක්ෂිතව බැහැර කිරීමට ක්‍රියාමාර්ග ගෙන ඇත. | ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රමවේදය නිසි පරිදි අනුගමනය කළ යුතුවේ. |
| (ii) සභාව විසින් අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳව නිලධාරීන්ට පුහුණුවීම් කිසිවක් ලබාදී නොතිබුණු අතර කම්කරුවන් 02දෙනෙකුට වාර්ෂිකව සිදුකළ යුතු වෛද්‍ය පරීක්ෂණයන්ද සිදුකර නොතිබුණි. | ඉදිරියේදි සැලකිල්ලට භාජනය කර ක්‍රියාත්මක කරනු ලැබේ. | අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳව පුහුණුවීම් ලබාදිය යුතු අතර වෛද්‍ය පරීක්ෂණයන්ද සිදු කළ යුතුවේ. |

**(ඉ) පාරිසරික ගැටළු**

| විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (i) අපද්‍රව්‍ය වෙන් කළ හැකි වෙන වෙනම පොදි කිරිමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක නොකර රැස්කරන අපද්‍රව්‍ය ගිනි තැබීම හේතුවෙන් පරිසරය දූෂණයට ලක් වේ. | පරිසරයට හානියක් නොවන අයුරින් අපද්‍රව්‍ය ඉවත් කරනු ලැබේ. | පරිසරයට හානියක් නොවන අයුරින් රැස්කරන අපද්‍රව්‍ය විනාශ කළ යුතුවේ. |
| (ii) නාච්චිකුඩා, වාඩියඩිහි දෛනිකව විකුණනු ලබන මාංෂයන්ගේ අපද්‍රව්‍ය සහ ඇටකටු එහි පිටුපස පිහිටි ජලාශයේ බැහැර කිරීම නිසා දුර්ගන්දය පැතිරෙන අතර අවට ජලාශ්‍රිත ප්‍රදේශ හානියට පත්වී තිබුණි. | සෞඛ්‍යාරක්ෂිතව අපද්‍රව්‍ය බැහැර කරනු ලැබේ. | පරිසරය ආරක්ෂා කිරීමට පියවර ගත යුතුවේ. |

**(ඊ) තිරසාර සංවර්ධන ඉලක්ක**

| විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| තිරසාර සංවර්ධන ඉලක්ක පිළිබඳ දීර්ඝකාලීන පදනමින් සැලැසුම් සකස් කර නොතිබුණි. | අදාල ඉලක්ක නිර්නය කර ක්‍රියාත්මක වේ. | දීර්ඝකාලීන සැලැසුම් සකස් කළ යුතුවේ. |

## 3.2 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| **සේවක පුරප්පාඩු සහ අතිරික්තයන්**<br>2019 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත සේවක සංඛ්‍යාව 72 ක් ද තථ්‍ය සේවක සංඛ්‍යාව 44 ක් වශයෙන් ද පැවතුණු අතර පුරප්පාඩුව පැවති සේවක සංඛ්‍යා තනතුරු 28 ක පුරප්පාඩු පුරවා නොතිබුණි. | සම්මුඛ පරීක්ෂණ පවත්වා ඇත. තනතුරු ලබාදීමට අනුමැතිය ලැබී නොතිබුණි. | පුරප්පාඩු පිරවීමට සුදුසු කටයුතු කළ යුතුය. |

## 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2017 වර්ෂයේ සිට 2019 දක්වා ගොඩනැගිලි ඉදිකිරීම් අනුමැතිය සඳහා අයදුම්පත්‍ර 335ක් ලැබී තිබූ නමුත් ගොඩනැගිලි ඉදිකිරීම් අනුකූලතා සහතික 17ක් පමණක් නිකුත් කර තිබුණි. අනුමත නොවූ ගොඩනැගිලි 318ක් ඉදිකිරීම් සම්බන්ධයෙන් ඵලදායි ක්‍රියාමාර්ග කිසිවක් ගෙන නොතිබුණි. | ගොඩනැගිලි අයදුම්පත් සඳහා ක්‍රියාමාර්ග ගනු ලබමින් පවතී. | ප්‍රාදේශීය සභා පනත අනුව සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුවේ. |

## 3.4 වත්කම් කළමනාකරණය

### (අ) වත්කම් ලේඛනගත කිරීම

| විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සභාවේ ධාවන තත්ත්වයේ පවතින වාහන 12ක් 2009 වර්ෂයේ සිට මේ දක්වා සභාවේ නමට පවරා ගැනීමට කටයුතු නොකර අඛණ්ඩව පරිත්‍යාගශීලීන්ගේ නමින්ම පවතී. | සභවේ නමට මාරු කිරීමට කටයුතු කරමින් පවතී. | අයිතිය පැවරීම් නියමිත කාලයේදි සිදු කළ යුතුය. |

## 3.4.2 වත්කම්වල ආරක්ෂාව තහවුරු කිරීම

| විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සභාවේ වාහන 04ක සඳහා ආදායම් බලපත්‍ර සහ රක්ෂණාවරණය ලබාගෙන නොතිබූ අතර වාහන 03ක ආදායම් බලපත්‍ර සහ රක්ෂණාවරණය ආදිය කල් ඉකුත්වී තිබූ අතර ඒවා අලුත්කිරීම සඳහා කිසිදු පියවරක් ගෙන නොතිබුණි. | ක්‍රියාමාර්ග ගනිමින් පවතී. | නියමිත කාලයේදි වාහන ආදායම් බලපත්‍රය සහ රක්ෂණාවරණය ආදිය අලුත්කිරීම සඳහා පියවර ගත යුතුවේ. |

**3.4.3 නඩත්තුව හා අලුත්වැඩියා කිරීමට අපොහොසත් වීම**

| | විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාව සතු වාහන 06ක් වර්ෂ 01 සිට වර්ෂ 05කට අධික කාලයක සිට නිෂ්කාර්යව පැවැති අතර ධාවන තත්ත්වයට පත්කිරීම සඳහා අළුත්වැඩියා කිරීම සඳහා ඵලදායි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ක්‍රියාමාර්ග ගනිමින් පවති. | භාවිතා කිරීමට ක්‍රියාමාර්ග ගත යුතුවේ. |
| (ආ) | ජල බවුසර් 04ක් සහ ට්‍රේලර් වර්ෂ 05කට අධික කාලයක සිට මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි නොකර නිෂ්කාර්යවත්, මලකඩ තත්ත්වයෙත්, නඩත්තුවක් රහිතවත් දක්නට ලැබුණි. | ලියාපදිංචි කිරිමට කටයුතු කරනු ලබයි. | භාවිතා කිරීමට කටයුතු කළ යුතුවේ. |

**3.4.4 නිෂ්කාර්ය වත්කම්**

| විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2014 වර්ෂයේ සිට පූනකරි උප කාර්යාලය යටතේ වාඩියඩි වෙළඳපොල කඩකාමර සංකීර්ණයේ කඩකාමර 11ක් වර්ෂ 06කට අධික කාලයක සිට නිෂ්කාර්යව පැවතුණි. | කඩකාමර ලබාදිමට කටයුතු කරමින් පවති. | කඩකාමර නියමිත කාලයේ භාවිතා කිරීමට ක්‍රියාමාර්ග ගත යුතුය. |